# ලංසු ආරාධනය

## ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය

## ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව

## හලාවත ධීවර වරායේ මායිම් වැට සහ පොදු වැසිකිළිය නවීකරණය කිරීම

**කොන්ත්‍රාත් අංකය - CFHC/PD/BFPTCH/2026-64**

01. ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව වෙනුවෙන්, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (DPC) සභාපති විසින් ඉහත කාර්යය සිදු කිරීම සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍ර, තැබූ ලංසු කැඳවනු ලැබේ. මෙම කාර්යයට කඩා ඉවත් කිරීමේ වැඩ, ඉවත් කිරීමේ කටයුතු, කොන්ක්‍රීට් වැඩ, සිමෙන්ති බ්ලොක් සහ ගඩොල් වැඩ, පිරවුම් වැඩ, ටයිල් ඇල්ලීමේ වැඩ සහ ඇලුමිනියම් දොර ජනෙල් නැවත සවි කිරීම සහ තීන්ත ආලේප කිරීම ආදිය ඇතුළත් වේ. ආසන්නතම ඉංජිනේරු ඇස්තමේන්තුගත පිරිවැය, අනපේක්ෂිත වියදම් සහ වැට් (VAT) බදු රහිතව රුපියල් මිලියන 10.75 කි.

02. ජාතික තරඟකාරී ලංසු ක්‍රමය මගින් ලංසු කැඳවීම සිදු කෙරේ.

03. ලංසුකරු පහත සඳහන් සුදුසුකම් තීරණායකයන් සපුරාලිය යුතුය:

- සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගතව නොසිටිය යුතුය
- ලංසු ඉදිරිපත් කරන අවස්ථාවේ දී ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ C7, C6 හෝ C5 ශ්‍රේණියේ CIDA ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

04. ලංසුකරු පහත සුදුසුකම් තීරණායකයන්ට අනුකූල විය යුතුය:

1. පසුගිය වසර පහ තුළ (2019, 2020, 2023, 2024, 2025) ඉටු කරන ලද ඉදිකිරීම් කාර්යයන්හි වාර්ෂික පරිමාවේ සාමාන්‍යය අවම වශයෙන් ශ්‍රීලං රුපියල් මිලියන 10.75 ක් විය යුතුය.
2. පසුගිය වසර 10 තුළ සමාන ස්වභාවයේ සහ සංකීර්ණත්වයකින් යුත් අවම වශයෙන් එක් කොන්ත්‍රාත්තුවක් ප්‍රධාන කොන්ත්‍රාත්කරු ලෙස ඉටුකර තිබිය යුතුය (මෙම අවශ්‍යතාවය සපුරාලීම සඳහා, සඳහන් කරන ලද කාර්යයන් අවම වශයෙන් 70% ක් සම්පූර්ණ වී තිබිය යුතුය). ශ්‍රී ලංකා රුපියල් මිලියන 7.5 කි.
3. ව්‍යාපෘතිය අවසන් වන දිනය දක්වා, අනෙකුත් කොන්ත්‍රාත්මය බැඳීම්වලින් සහ මෙම කොන්ත්‍රාත්තුව යටතේ සිදු කරනු ලබන අත්තිකාරම් ගෙවීම් හැර, තිබිය යුතු අවම ද්‍රවශීල වත්කම් හෝ ණය පහසුකම් ප්‍රමාණය ශ්‍රී ලංකා රුපියල් මිලියන 10.75 ට නොඅඩු විය යුතුය.
4. රුපියල් මිලියන 5 ඉක්මවන සෑම ලංසුවක් සඳහාම, 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 8 වන වගන්තියට අනුකූලව, පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කරන ලද වලංගු සහතිකයක් ලංසුකරු සතු විය යුතුය. මෙය කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා වන සුදුසුකමකි.

05. මෙම ලංසුව සඳහා ඉදිකිරීම් කාලය ලිත් දින 90ක් වන අතර ව්‍යාපෘතියේ ස්ථානය පුත්තලම දිස්ත්‍රික්කයේ හලාවත ධීවර වරාය වේ.

06. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු), සිවිල් ඉංජිනේරු අංශය, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක 15, රොක් හවුස් පටුමග, කොළඹ 15 වෙත 011-2529391 යන දුරකථන අංකය මගින් ලබාගත හැකි අතර, ප්‍රසම්පාදන ලේඛන "ප්‍රසම්පාදන අංශය, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක 15, රොක් හවුස් පටුමග, කොළඹ 15" යන කාර්යාලයේදී (නොමිලේ) පරීක්ෂා කළ හැක.

07. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ඉංග්‍රීසි භාෂාවෙන් සැකසූ සම්පූර්ණ ප්‍රසම්පාදන ලේඛන කට්ටලය, 2026.07.21 සිට 2026.08.11 දක්වා ඕනෑම වැඩ කරන දිනකදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා, "**ප්‍රසම්පාදන කළමනාකරු, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක 15, රොක් හවුස් පාර, කොළඹ 15**" වෙත ව්‍යාපාරික ලිපි ශීර්ෂයක ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසු, ආපසු ගෙවනු නොලබන රු. 3,500.00 ක ගාස්තුවක් ගෙවා ලබා ගත හැක.

08. ලංසු 2026.10.27 දක්වා (දින 77ක්) වලංගු විය යුතුය.

09. සියලුම ලංසු, රුපියල් එක්ලක්ෂ හැට දහසක (රු. 160,000.00) ලංසු සුරකුම් තැන්පතුවක් (බැංකු ඇපකරයක් හෝ ආපසු ගෙවිය හැකි මුදල් තැන්පතුවක්) ඉදිරිපත් කළ යුතුය. එය ලංසු විවෘත කරන දින සිට දින 105ක් (2026.11.24 දක්වා) වලංගු විය යුතුය. තැන්පතු ලදුපතේ පිටපත ලංසුව සමඟ අමුණා තිබිය යුතුය.

10. මුද්‍ර, තැබූ ලංසුව සහ එහි අනු පිටපත "**සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, ප්‍රසම්පාදන අංශය, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක 15, රොක් හවුස් පාර, කොළඹ 15**" වෙත 2026.08.12 දින පෙ.ව. 11.00 ට හෝ ඊට පෙර ගෙනැවිත් භාර දිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. එම අවස්ථාවට පුද්ගලිකව පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරියේ විවෘත කෙරේ. (ලංසු විවෘත කරන අවස්ථාවට පැමිණ සිටින මෙන් ලංසුකකරුවන්ගෙන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.)

11. පූර්ව ලංසු රැස්වීමක් **2026.07.31** දින **පෙ.ව. 11.00 ට** ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක 15, රොක් හවුස් පාර, කොළඹ 15 යන ස්ථානයේදී පැවැත්වේ.

12. සියලුම ලංසුකරුවන්ගෙන් CIDA/ SBD/01, දෙවන සංස්කරණය, ජනවාරි 2007 (පසුකාලීන ICTAD/SBD/01 ඇතුළුව) ලේඛනය හොඳින් කියවා බලන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ප්‍රසම්පාදන අංශය,**
**ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව,**
**අංක 15, රොක් හවුස් පාර,**
**කොළඹ 15.**